‘මිහින්තලේ’ කීවාම
එක පාරට ම මතක් වෙන්නේ මිහිඳු හාමුදුරුවෝ.
මිහින්තලේ කන්දට නම වැටුණොත්
මිහිඳු හාමුදුරුවන් හින්දා.

හැබැයි තවත් කරුණාවන්ත ඥානවන්ත හාමුදුරුවරු
රාශියක් මිහින්තලේ වැඩ හිඳලා තියෙනවා.
ඉන් එක් හාමුදුරු නමක් තමයි
‘දීඝ භාණක අභය’ නම් හාමුදුරුවෝ.

ඒ හාමුදුරුවන් ගැන රසවත් කතාවක් තියෙනවා,
මෙන්න මේ වගෙ.

Sumitha Publishers

ඔන්න බොහෝම ඉස්සර කාලෙ
මිහින්තලා කන්දට යන එක පාරක් තිබුණෙ
කොළොම් ඔය පැත්තෙන්.
ඔය පාර කිට්ටුව හොරු රංචුවක්
කඳවුරු බැඳ ගෙන හිටියා.
ඒ අය කොච්චර නපුරු ද කියා කියනවා නම්
මිහින්තලේ වඳින්ට යන අයටත් හිංසා පීඩා කළා.
මේ ආරංචිය අහපු බොහෝ දෙනා ඒ පාරෙන්
මිහින්තලේ වඳින්ට යන්ටත් බය වුණා.



Sumitha Publishers